# අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

| | |
|---|---|
| **ව්‍යාපාර අධ්‍යයනය I** | **පැය දෙකයි** |

සැලකිය යුතුයි :

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

**1.** මිනිස් අවශ්‍යතා හා වුවමනාවලට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ. මින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) මිනිස් අවශ්‍යතා අනිවාර්ය වේ. - වුවමනා අනිවාර්ය නොවේ.
(2) අවශ්‍යතා සඳහා විකල්ප ඇත. - වුවමනා සඳහා විකල්ප නොමැත.
(3) අවශ්‍යතා නිර්මාණය කළ නොහැකි ය. - වුවමනා නිර්මාණය කළ නොහැකි ය.
(4) අවශ්‍යතා ප්‍රාථමික වේ. - වුවමනා ප්‍රාථමික වේ.
(5) අවශ්‍යතා විවිධ වේ. - වුවමනා විවිධ නොවේ. (........)

**2.** ව්‍යාපාර පරිසර වර්ග හා ඊට අයත් බලවේග පහත දැක් වේ. ඒ අතරින් ආසන්න පරිසරයට **පමණක්** අයත් බලවේග කාණ්ඩය තෝරන්න.

(1) ගණුදෙනුකරුවෝ / සමාජ සංස්කෘතිය
(2) සමාජ සංස්කෘතිය / සංවිධානය ව්‍යුහය
(3) විභව ආයෝජකයෝ / ගණුදෙනුකරුවෝ
(4) විභව ආයෝජකයෝ / සංවිධානය ව්‍යුහය
(5) සංවිධාන ව්‍යුහය / ප්‍රජාව (........)

The National e-learning Portal for The General Education

**3.** ව්‍යාපාරයක් ඉටු කළ යුතු සමාජ වගකීම් පහත දැක් වේ. ඒ අතරින් ගණුදෙනුකරුවන් සඳහා **පමණක්** අදාළ වන සමාජ වගකීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සමානාත්මතාව / සෞඛ්‍ය පහසුකම් / සාධාරණ වීම.
(2) හානි අවම කිරීම / පරිසර හිතකාමී වීම / සමානාත්මතාව.
(3) අයිතිවාසිකම් ආරක්ෂා කිරීම / වෘත්තීමය ආරක්ෂාව / පරිසර හිතකාමී වීම.
(4) සාධාරණ වීම / හානි අවම කිරීම / අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
(5) සෞඛ්‍ය පහසුකම් / සමානාත්මතාව / සාධාරණ වීම. (........)

**4.** ප්‍රමිති සංකේත කිහිපයක් පහත දැක් වේ.




A B C D E

ප්‍රමිති නාම

1. උපද්‍රව විශ්ලේෂණය සහ අති අවදානම් ස්ථාන පාලනය
2. තත්ත්ව කළමනාකරණ පද්ධති
3. මනා සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන පිළිවෙත්
4. වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිත කළමනාකරණය
5. පරිසර කළමනාකරණ පද්ධති

ඉහත ප්‍රමිති සංකේතවලට අදාළ ප්‍රමිති නාම පිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A - 1 B - 2 C - 3 D - 4 E - 5
(2) A - 2 B - 1 C - 4 D - 3 E - 5
(3) A - 3 B - 4 C - 5 D - 2 E - 3
(4) A - 4 B - 5 C - 1 D - 3 E - 2
(5) A - 5 B - 3 C - 4 D - 3 E - 1 (........)

[2 වැනි පිටුව බලන්න

**5.** පහත දැක්වෙන්නේ පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කළ පාර්ශව හා පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් ය.

| X | Y |
|---|---|
| A ජෝන් එෆ් කෙනඩි<br>B පාරිභෝගික ජාත්‍යන්තරය | 1. ආරක්ෂාව සලසා ගැනීම<br>2. සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීම<br>3. තොරතුරු දැන ගැනීම<br>4. වන්දි ලබා ගැනීම<br>5. තෝරා ගැනීම<br>6. පාරිභෝගික අධ්‍යාපනය<br>7. සවන් යොමු කර ගැනීම<br>8. මූලික අවශ්‍යතා සපුරා ගැනීම |

X හා Y තීරු ගැළපූ විට, වඩාත් ම නිවැරදි පිළිතුර වන්නේ,

(1) A - 1, 2, 3, 4 B - 5, 6, 7, 8
(2) A - 2, 3, 4, 5 B - 1, 6, 7, 8
(3) A - 2, 6, 7, 8 B - 1, 3, 4, 5
(4) A - 1, 2, 4, 5 B - 3, 6, 7, 8
(5) A - 1, 3, 5, 7 B - 2, 4, 6, 8 (........)

**6.** රජයක ආර්ථික අරමුණුවලට අදාළ ප්‍රකාශ පහත දැක් වේ.

| ආර්ථික අරමුණු | ප්‍රකාශ |
|---|---|
| A පූර්ණ සේවා නියුක්තිය<br>B ආර්ථික වෘද්ධිය<br>C ආර්ථික නිදහස | 1. උද්ධමන පාලනය<br>2. සාධාරණ ලෙස ආදායම් බෙදී යාම<br>3. පාරිභෝගික, ව්‍යාපාරික, ශ්‍රමිකයන් යන පාර්ශවවලට ක්‍රියාකාරකම් සඳහා දායක වීම<br>4. රටේ සියලු ම නිෂ්පාදන සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම<br>5. රටේ නිෂ්පාදන ධාරිතාව උපරිමයෙන් අඛණ්ඩව පවත්වා ගෙන යාම |

ආර්ථික අරමුණුවලට ගැළපෙන නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A - 3 B - 5 C - 4
(2) A - 3 B - 4 C - 2
(3) A - 1 B - 2 C - 3
(4) A - 4 B - 5 C - 3
(5) A - 5 B - 3 C - 1 (........)

**7.** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ගවලින් කිහිපයක් පහත දැක් වේ.

A - කේවල ස්වාමි ව්‍යාපාර
B - හවුල් ව්‍යාපාර
C - සීමිත පෞද්ගලික සමාගම්
D - සීමිත පොදු සමාගම්

ලාභ ලැබීම අරමුණ වුව ද පුද්ගලික අංශයට අයත් වූ ද නීතිමය පුද්ගලභාවය නොමැති ව්‍යාපාර සංවිධාන වන්නේ,

(1) A, B (2) A, C (3) B, C (4) B, D (5) C, D (........)

**8.** පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන කිහිපයකි.

A - හවුල් ව්‍යාපාර
B - වෘත්තීය හවුල් ව්‍යාපාර
C - සීමිත පෞද්ගලික සමාගම්
D - සමුපකාර සමිති

මෙහි අවම හිමිකරුවන් හා උපරිම හිමිකරුවන් නිවැරදි ව පෙන්වන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) A - (2 - 10) B - (2 - 50) C - (2 - 10) D - ( 7 - 50)
(2) A - (2 - 10) B - (2 - සීමාවක් නැත) C - (1 - 10) D - (10 - 50)
(3) A - (2 - 20) B - (2 - සීමාවක් නැත) C - (1 - 50) D - (10 - සීමාවක් නැත)
(4) A - (2 - 50) B - (2 - 10) C - (2 - 50) D - (10 - 20)
(5) A - (2 - 20) B - (2 - සීමාවක් නැත) C - (2 - 50) D - (20 - සීමාවක් නැත) (........)

**9.** පහත ප්‍රකාශ අතරින් ව්‍යවසායකත්ව යන සංකල්පයට ආසන්නත ම පිළිතුර තෝරන්න.

(1) සාගර මසුන් ඇල්ලීම සඳහා පාරම්පරික ශිල්පීය ක්‍රම නවීකරණය කරයි.
(2) අමිල සම්ප්‍රදායික ඖෂධයක් වෙනුවට ආනයනය කළ අමුද්‍රව්‍ය යොදා නව ඖෂධයක් නිර්මාණය කරයි.
(3) දිනිත් ක්‍රීඩා තරගයකින් ජය ගැනීම සඳහා දිනපතා ව්‍යායාම කටයුතුවලට යෙදේ.
(4) රජිත මහමැතිවරණයකින් ජය ගැනීම සඳහා ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස නොමිලයේ පොත් බෙදා දෙයි.
(5) අජිත් ග්‍රාමීය රෝහලක දියවැඩියා රෝගීන් ඉලක්ක කර නව ඖෂධීය කොළකැඳ විකිණීමෙහි නිරත වේ. (........)



The National e-Learning Portal for The General Education

**10.** ව්‍යාවසායකත්වය ලෝකයට හඳුන්වාදුන් රට සහ වැඩි වශයෙන් එම සංකල්පය භාවිත කරන රටවල් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඉන්දියාව හා සංවර්ධිත රටවල්
(2) එංගලන්තය හා සංවර්ධනය වෙමින් පවතින රටවල්
(3) ප්‍රංශය හා සංවර්ධිත රටවල්
(4) ප්‍රංශය හා සංවර්ධනය වෙමින් පවතින රටවල්
(5) පිලිපීනය හා සංවර්ධිත රටවල් (........)

**11.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සෑම චෙක්පතකම වලංගු කාලය මාස හයක් පමණි.
(2) චෙක්පත් තැන්පත් කළ හැක්කේ ජංගම ගිණුමක පමණි.
(3) සෑම චෙක්පතකම රේඛන අණකරුට අවලංගු කළ හැකි ය.
(4) බැංකු අයිරාවකට ඇප අනිවාර්ය වේ.
(5) ජංගම ගිණුමක්, ආරම්භ කිරීමට අදාළ බැංකු කළමණාකරුගේ අනුමැතිය අනිවාර්ය වේ. (........)

**12.** පහත වගුවේ දැක්වෙන්නේ රක්ෂණ මූලධර්ම හා ඒවායේ ලක්ෂණයන් ය.

| X | Y |
|---|---|
| A උපරිම විශ්වාසය | 1. දේපළක් තිබීමෙන් වාසියක් ද නොතිබීමෙන් අවාසියක් ද වේ |
| B රක්ෂණ හිමිකම | 2. රක්ෂකයා හා රක්ෂිතයා සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කිරීම |
| C හානි පූරණය | 3. රක්ෂණය සුදුවකින් වෙනස් වීම |
| D ආසන්නතම හේතුව | 4. ආවරණය නොවූ අවදානමකට වන්දි හිමි නොවේ |

X හා Y නිවැරදි ව ගැළපූ විට පිළිතුර වනුයේ,

(1) A - 1 B - 2 C - 3 D - 4
(2) A - 2 B - 1 C - 3 D - 4
(3) A - 2 B - 3 C - 1 D - 4
(4) A - 3 B - 2 C - 4 D - 1
(5) A - 4 B - 3 C - 2 D - 1 (........)

**13.** ශ්‍රී ලංකාව තුළ අධිවේගී මාර්ග ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් දැකිය හැකි ය.

A - දක්ෂිණ අධිවේගී මාර්ගය
B - කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය
C - කොට්ටාව - කඩුවෙල පිටත වටරවුම් අධිවේගී මාර්ගය

මෙම මාර්ග හඳුන්වන සංකේත අක්ෂරය හා අංකය පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) A - (E - 01), B - (E - 02), C - (E - 03)
(2) A - (E - 01), B - (E - 03), C - (E - 02)
(3) A - (E - 02), B - (E - 01), C - (E - 03)
(4) A - (E - 02), B - (E - 03), C - (E - 01)
(5) A - (E - 03), B - (E - 01), C - (E - 02) (........)

**14.**

| ලියවිලි | නිකුත් කරන ආයතන |
|---|---|
| A වාහන යෝග්‍යතා සහතිකය | 1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| B ආදායම් බලපත්‍රය | 2. මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| C රියදුරු බලපත්‍රය | 3. රජය අනුමත ගරාජ |
| D වීසා බලපත්‍රය | 4. තානාපති කාර්යාලය |
| E නෞභාරපත | 5. නැව් සමාගම් |

ඉහත සඳහන් වගුවේ ලියවිලි හා ඒවා නිකුත් කරන ආයතන දැක් වේ. ඒවා නිවැරදිව ගැළපූ විට පිළිතුරු ඇතුළත් කාණ්ඩ වනුයේ,

(1) A - 1 B - 4 C - 3 D - 2 E - 3
(2) A - 2 B - 1 C - 3 D - 5 E - 2
(3) A - 3 B - 1 C - 2 D - 4 E - 5
(4) A - 4 B - 2 C - 1 D - 3 E - 5
(5) A - 5 B - 3 C - 4 D - 2 E - 1 (........)

**15.** පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

A - යුරෝපීය රටවල් විශාල ගණනක් එකතුවෙන් ඇති කර ගෙන ඇති වෙළෙඳාම, ආර්ථික, සමාජීය වර්ධනයට පිහිටුවා ඇති සංගමයකි.

B - ශ්‍රී ලංකාව, ඉන්දියාව ඇතුළු ආසියාතික රටවල් අටක ආර්ථික සහයෝගීතාව සඳහා පිහිටුවා ගත් සංවිධානයකි.

C - නිදහස් ජාත්‍යන්තර වෙළෙඳාම ව්‍යාප්ත කිරීමට බිහි වූ ප්‍රකට සංවිධානයකි.

D - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම

ඉහත තොරතුරුවලට අදාළ සංවිධාන පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) NAFTA / SAARC / GSP+ / EU ලෙස ය.
(2) G-8 / ASIAN / WTO / NAFTA ලෙස ය.
(3) EU / SAARC / GSP+ / NAFTA ලෙස ය.
(4) GSP+ / SAARC / EU / WTO ලෙස ය.
(5) EU / SAARC / NAFTA / GSP + ලෙස ය. (........)

**16.** කළමනාකරුවන් වර්ග කරන පදනම් හා නිදසුන් පහත වගුවේ දැක් වේ.

| X | Y |
|---|---|
| A කළමනාකරණ මට්ටම අනුව | 1. මානව සම්පත් කළමණාකරු |
| B කාර්යයන්වල විෂය පථය අනුව | 2. මධ්‍යම කළමණාකරු |
| C කාර්යයන්වල වගකීම අනුව | 3. රේඛීය කළමණාකරු |

X හා Y නිවැරදි ව ගැළපූ විට නිවැරදි කාණ්ඩය වනුයේ,

(1) A - 1 B - 2 C - 3
(2) A - 1 B - 3 C - 2
(3) A - 2 B - 1 C - 3
(4) A - 3 B - 1 C - 2
(5) A - 3 B - 2 C - 1 (........)

**17.** ''කේශර'' ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරයෙකි. ඔහුට අයත් තනතුර මත ලැබෙන බලය හඳුන්වන්නේ,

(1) නීත්‍යානුකූල බලය ලෙස ය.
(2) අනුහස් බලය ලෙස ය.
(3) විශේෂඥ බලය ලෙස ය.
(4) පරිපාලන බලය ලෙස ය.
(5) පෞරුෂත්ව බලය ලෙස ය. (........)

**18.**

| X | Y |
|---|---|
| A ජාතික සන්නම | 1. එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම |
| B පෞද්ගලික සන්නම | 2. එකම ආයතනයක නිෂ්පාදිත සඳහා වෙන් වෙන් ව සන්නම් භාවිත කිරීම |
| C පවුල් සන්නම | 3. නිෂ්පාදකයා විසින් නිෂ්පාදිත වෙළෙඳුන්ට අලෙවි කළ පසුව වෙළෙඳුන් විසින් එම නිෂ්පාදන සඳහා යොදන සන්නම |
| D භාණ්ඩ සන්නම | 4. වෙළෙඳපොළට ස්වකීය සන්නම භාවිත කිරීම |

X තීරුවේ සන්නම් වර්ග ද Y තීරුවේ ඒවායේ කෙටි අර්ථ දැක්වීම නිවැරදි ව ගැළපූ විට පිළිතුර වනුයේ,

(1) A - 1 B - 2 C - 3 D - 4
(2) A - 2 B - 4 C - 1 D - 3
(3) A - 3 B - 1 C - 4 D - 2
(4) A - 4 B - 3 C - 1 D - 2
(5) A - 4 B - 3 C - 2 D - 1 (........)

**19.** පාරිභෝගිකයා කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වන අලෙවිකරණ සංකල්පය,

(1) නිෂ්පාදන සංකල්පය යි.
(2) නිෂ්පාදිත සංකල්පය යි.
(3) අලෙවිකරණ සංකල්පය යි.
(4) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය යි.
(5) සමාජයීය අලෙවිකරණ සංකල්පය යි. (........)

**20.** රජයට අවශ්‍ය මධ්‍යකාලීන හා දිගුකාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීමට රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂය වන්නේ,

(1) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ය.
(2) භාණ්ඩාගාර බැඳුම්කර ය.
(3) රුපියල් සුරැකුම්පත් ය.
(4) සංවෘත ණයකර ය.
(5) ඒකක භාර ය. (........)

**21.** භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට අවසරය ලබා ගත යුත්තේ,

(1) ජනාධිපතිවරයාගෙනි.
(2) මුදල් ඇමතිවරයාගෙනි.
(3) මහ බැංකුවේ අධිපතිවරයාගෙනි.
(4) භාණ්ඩාගාර ලේකම්ගෙනි.
(5) පාර්ලිමේන්තුවෙනි. (........)

The National e-Learning Portal for The General Education

**22.** පහත දැක්වෙන්නේ කළමනාකරණ පුහුණු හා සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ ලක්ෂණයන් ය.

A - සංකල්පනාත්මක කුසලතා ලබා දේ.
B - සාපේක්ෂව දිගු කාලීන වේ.
C - තාක්ෂණික කුසලතා ලබා දේ.
D - සාපේක්ෂව කෙටි කාලීන වේ.
E - කළමනාකරණ සේවකයින් ඉලක්ක කර ගනී.
F - අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.
G - ආයතනයේ අනාගත අවශ්‍යතා සඳහා වේ.

මේවා අතරින් සංවර්ධන වැඩසටහන්වල ලක්ෂණ වන්නේ,

(1) A, B, E, G (2) A, C, D, G (3) A, C, E, F (4) A, D, F, G (5) A, F, D, C (........)

**23.** නවීන්ගේ ව්‍යාපාරයේ 2014.12.31 දිනට මූල්‍ය තත්ත්ව තොරතුරු පහත දැක් වේ.

| | රුපියල් |
|---|---|
| බඩු තොගය | 25 000 |
| ණය ගැතියෝ | 30 000 |
| කලින් ගෙවූ රක්ෂණය | 10 000 |
| මුදල් ශේෂය | 5 000 |
| ඉදිරියට ලැබූ කඩ කුලී | 6 000 |
| ණයහිමියෝ | 22 000 |
| උපචිත විදුලි ගාස්තු | 5 000 |

දළ කාරක ප්‍රාග්ධනය හා ශුද්ධ කාරක ප්‍රාග්ධනය පිළිවෙළින් රුපියල්

(1) 70 000 හා 37 000 කි. (2) 70 000 හා 33 000 කි. (3) 33 000 හා 70 000 කි.
(4) 37 000 හා 70 000 කි. (5) 76 000 හා 49 000 කි. (........)

**24.** දිනිත්, ජනිත් හා සලිත් රාජ්‍ය පරිපාලන සේවයේ නිරත විධායක නිලධාරීන් තිදෙනෙකි.

| නම | සේවා කාලය අවුරුදු II ශ්‍රේණිය | මුළු සේවා කාලය අවුරුදු |
|---|---|---|
| දිනිත් | 05 | 20 |
| ජනිත් | 07 | 10 |
| සලිත් | 06 | 25 |

මෙම තිදෙනාගෙන් එක් අයකු I වන ශ්‍රේණියට උසස් කළ යුතු ව ඇත. වඩාත් සුදුසු පුද්ගලයාට අදාළ ප්‍රකාශය වන්නේ,

(1) මුළු සේවා කාලය දිනිත්ට වඩා වැඩි නිසා සලිත් සුදුසු වේ.
(2) II වැනි ශ්‍රේණියේ සේවා කාලය වැඩි නිසා ජනිත් සුදුසු වේ.
(3) ජ්‍යෙෂ්ඨ නිසා දිනිත් සුදුසු වේ.
(4) මුළු සේවා කාලය අවුරුදු 25ක් සම්පූර්ණ වී විශ්‍රාම යෑමට ආසන්න නිසා සලිත් සුදුසු වේ.
(5) II වැනි ශ්‍රේණියේ සේවා කාලය අඩු නිසා දිනිත් සුදුසු වේ. (........)

**25.** වාණිජ බැංකුවක තැන්පත් භාර ගැනීම, මුදල් ගෙවීම්, උකස් කටයුතු, චෙක්පත් නිෂ්කාශනය, ණය නිකුත් කිරීම් ලෙස කාර්ය සමූහයකි. මේවා ඉටු කිරීමට වෙන වෙන ම තනතුරු ඇති කිරීම හඳුන්වනුයේ,

(1) රැකියා විශ්ලේෂණය ලෙස ය. (2) රැකියා නිර්මාණය ලෙස ය. (3) කාර්යඵල ඇගයීම් ලෙස ය.
(4) රැකියා විස්තරය ලෙස ය. (5) රැකියා පිරිවිතරය ලෙස ය. (........)

**26.** බාහිර සේවක ආකර්ෂණය තුළින් ලබාගත හැකි වාසියක් වන්නේ,

(1) ආයතනයට ලැදියාවක් ඇති අයදුම්කරුවන් පිරිසක් ආකර්ෂණය කිරීමේ හැකියාව යි.
(2) නව දැනුමෙන් යාවත්කාලීන වූ සේවක පිරිසක් බඳවා ගැනීමේ හැකියාව යි.
(3) අභ්‍යන්තර සේවක ආරවුල් ඇති නොවීම යි.
(4) පිරිවැය අඩු වීම යි.
(5) අභ්‍යන්තර සේවක තෘප්තිය ඉහළ යාම යි. (........)

**27.** දත්ත සැකසුම් ක්‍රියාවලියේ කාර්යයන්වලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

(1) වර්ගීකරණය / තේරීම / විද්‍යුත් දත්ත සැකසීම / විද්‍යුත් යාන්ත්‍රික
(2) වර්ගීකරණය / සාරාංශකරණය / ගණනය කිරීම / විද්‍යුත් දත්ත සැකසීම
(3) තේරීම / ගණනය කිරීම / සාරාංශකරණය / විද්‍යුත් යාන්ත්‍රික
(4) වර්ගීකරණය / තේරීම / ගණනය කිරීම / සාරාංශකරණය
(5) වර්ගීකරණය /සාරාංශකරණය / විද්‍යුත් දත්ත සැකසීම / විද්‍යුත් යාන්ත්‍රික (........)

[6 වැනි පිටුව බලන්න

**28.** එක්තරා නිෂ්පාදන ආයතනයක තොරතුරු පහත දැක් වේ.

| | |
|---|---|
| පරිභෝජන ඒකක ගණන | 180 |
| ඒකකයක ඇණවුම් පිරිවැය | රු. 100/- |
| ඒකකයක නඩත්තු පිරිවැය | රු. 10/- |
| ඒකකයක ගැණුම් මිල | රු. 180/- |

නැවත ඇණවුම් ප්‍රමාණය වන්නේ, ඒකක

(1) 18 කි. (2) 60 කි. (3) 180 කි. (4) 600 කි. (5) 1 800 කි. (........)

**29.** කළමනාකරණ මට්ටමේ දී ආයෝජන ඇගයීම හා ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීම වැනි තීරණ ගැනීම සඳහා භාවිත කළ හැකි තොරතුරු පද්ධතිය වනුයේ,

(1) දැනුම් කාර්ය පද්ධතිය යි. (2) කළමණාකරණ තොරතුරු පද්ධතිය යි.
(3) තීරණ උපකාරක පද්ධතිය යි. (4) ගණුදෙනු සැකසුම් පද්ධතිය යි.
(5) විධායක උපකාරක පද්ධතිය යි. (........)

**30.** මූල්‍ය හා අලෙවි සැලැස්මක අන්තර්ගත කරුණු කිහිපයක් පහත දැක් වේ.

A - සේවක අවශ්‍යතා B - ඉලක්ක වෙළෙඳපොළ C - තරගකාරීත්ව විශ්ලේෂණය
D - කර්මාන්තශාලා පිරියත E - අපේක්ෂිත අලෙවිය

ඉහත කරුණු අතරින් අලෙවි සැලැස්මක අන්තර්ගත තොරතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) A B C (2) A C D (3) B C D (4) B C E (5) C D E (........)

● **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

**31.** (අ) ව්‍යාපාරයක බාහිර පරිසරය සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් ............................................. වේ.

(ආ) සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් වන පරිදි කොටස්හිමියන්ගේ පෞද්ගලික දේපලට බලපෑමක් වන සමාගම් ......................................................... නමින් හැඳින් වේ.

**32.** (අ) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන පොළී අනුපාතය ........... ......................................................... වේ.

(ආ) ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හඳුන්වන්නේ ................. ......................................................... ලෙස ය.

**33.** (අ) රක්ෂණයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදුවීමට ඇති අවස්ථාව ...................... ......................................................... ලෙස ද එවැන්නක් ඇති වීමට ඇති ඉඩකඩ ......................................................... ලෙස ද හඳුන්වයි.

(ආ) වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් (ATM) සවිකිරීමේ දී අවසර ලබාගත යුත්තේ ......................................................... මගිනි.

**34.** (අ) එක් නිෂ්පාදකයකුගේ භාණ්ඩ බෙදාහැරීමට රටපුරා ශාඛා පවත්වාගෙන යන වෙළෙඳසැල් ......................... ...................................... ලෙස හඳුන්වයි.

(ආ) රටක් කිසිදු බාධාවකින් තොරව භාණ්ඩ ආනයන හා අපනයන කිරීමට අවකාශයක් පැවතීම ...................... ......................................................... නම් වේ.

**35.** (අ) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය එක් වී හඳුන්වා දී ඇති ප්‍රමිතිය ......................................................... වේ.

(ආ) විද්‍යාත්මක කළමණාකරණයේ පියා ලෙස සලකන්නේ ......................................................... ය.

**36.** (අ) වෙළෙඳ ලකුණක් ලෙස ලියාපදිංචි කළ බව මහජනයා වෙත දැනුම් දෙන්නේ ......................................... මගින් ය.

(ආ) ආයතනයක තීරණ ගැනීමේ වැඩි බලයක් ඉහළ කළමනාකරණය සතුවේ නම්, එය ......................................... ......................... ලෙස ද තීරණ ගැනීමේ වැඩි බලයක් පහළ කළමනාකරණ මට්ටම් දක්වා පවරා තිබේ නම්, එය ......................................................... ලෙස ද හැඳින් වේ.

The National e-learning Portal for The General Education

**37.** (අ) සන්නිවේදන ක්‍රමයක් වඩාත් ඵලදායි ලෙස පවත්වාගෙන යාමට පැවතිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(1) ......................................................................................................................................

(2) ......................................................................................................................................

(ආ) ව්‍යාපාර ආයතනයක් විසින් යොදාගනු ලබන අනෙකුත් සන්නිවේදන ක්‍රම සමග සසඳන කල ලිඛිත සන්නිවේදන ක්‍රමයක ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ......................................................................................................................................

(2) ......................................................................................................................................

**38.** (අ) ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන තීරණ දෙක (1) ...................................................... හා (2) ...................................................... වේ.

(ආ) මූල්‍ය අවශ්‍යතා වර්ග කළ හැකි මූලික පදනම් දෙක වනුයේ, (1) ...................................................... හා (2) ...................................................... වේ.

**39.** (අ) පහත දැක්වෙන ව්‍යාපාර ක්ෂේත්‍රවලට අදාළ පාලන උපකරණයන් ඉදිරියෙන් දක්වන්න.

මූල්‍ය ක්ෂේත්‍රය ...............................................................

මෙහෙයුම් ක්ෂේත්‍රය ...............................................................

(ආ) නගර සීමා බල ප්‍රදේශයක ක්‍රියාත්මක වන පරිගණක ජාලය ............................................ නමින් හැඳින් වේ.

**40.** (අ) පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවයක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ව ව්‍යවසායකයකු තුළ පවතින සිතුවිල්ල ...................................................... වේ.

(ආ) ඇල්මැති පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස ...................................................... නමින් හැඳින් වේ.

● **ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

**41.** (අ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඉටු කරන කාර්යයන් **දෙකක්** දක්වන්න.

(1) ......................................................................................................................................

(2) ......................................................................................................................................

(ආ) වරලත් ව්‍යාපාර වර්ග **දෙකක්** නම් කරන්න.

(1) ......................................................................................................................................

(2) ......................................................................................................................................

**42.** (අ) පුද්ගලික වත්කම් ආරක්ෂා කර ගැනීමට, නීතිමය පුද්ගලභාවය සහ අඛණ්ඩව පැවැත්මක් සහිතව එක් පුද්ගලයෙකුට ආරම්භ කළ හැකි අයිතිය සීමාවන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

......................................................................................................................................

(ආ) සීමිත සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියට සමාන සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිල්ල කුමක් ද?

......................................................................................................................................

**43.** (අ) අනුයාත ඇණවුම් දෙකක් අතර කාලය ...................................................... වන අතර, භාණ්ඩ ගබඩාවට ඇණවුම් කිරීමේ සිට ඒවා ළඟාවන තෙක් කාලයට අදාළ ඒකක ප්‍රමාණය ............................................ වේ.

(ආ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ කොටස් **හතර** දක්වන්න.

(1) ......................................................................................................................................

(2) ......................................................................................................................................

(3) ......................................................................................................................................

(4) ......................................................................................................................................

**44.** (අ) එක් එක් පාරිභෝගිකයාගේ සුවිශේෂී වුවමනාවන් තෘප්තිමත් කිරීමට අවධානය යොමු කරන අලෙවිකරණ සංකල්පය වන්නේ ...................................................... ය.

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමේ දී අලෙවිකරුවන් වැඩි වශයෙන් ප්‍රජා විද්‍යාත්මක සාධක යොදා ගැනීමට බලපාන හේතුව කුමක් ද?

......................................................................................................................................



The National e-learning Portal for The General Education

**45.** (අ) මූල්‍ය කළමණාකරණය තීරණයන්ට අදාළව කෙටිකාලීන ආයෝජන තීරණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(ආ) දිගු කාලීන මූල්‍යයන තීරණ **දෙකක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

**46.** (අ) කොටස් වෙළෙඳපොලේ කොටස්වල මිල දිගින් දිගටම පහළ යන ප්‍රවණතාවයක් පවතී නම්, එය හඳුන්වන්නේ කවර නමකින් ද?

..............................

(ආ) සීමිත පොදු සමාගමක් ණයකර නිකුත් කිරීමට වඩා සාමාන්‍ය කොටස් නිකුත් කර අරමුදල් සම්පාදනය කරගැනීමට අවධානය යොමු කිරීමට බලපාන හේතු **දෙකක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

**47.** (අ) මුදල් අයවැය ලේඛනයක් සකස් කිරීමේ ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

(ආ) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණ ඇසුරින් සකස් කළ හැකි මූල්‍ය අනුපාත වර්ග **හතරක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

**48.** (අ) මානව සම්පත් කළමණාකරණයේ පොදු අරමුණ කුමක් ද?

..............................

..............................

(ආ) සේවකයකුට වැටුපක් තීරණය කිරීමේ දී සලකා බලන සාධක මොනවා ද?

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

**49.** (අ) ව්‍යාපාර මූල්‍ය කළමණාකරණයේ මූලික අරමුණ වන්නේ, ..............................

(ආ) මූල්‍ය වෙළෙඳපළ උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කරගෙන වර්ග කළ හැකි ක්‍රම **දෙක** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**50.** (අ) ආයතනයක භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(ආ) ව්‍යාපාර සැලැස්මක මෙහෙයුම් සැලැස්මේ ඇතුළත් අංග **හතරක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

***

The National e-learning Portal for The General Education

## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

**ව්‍යාපාර අධ්‍යයනය II** | **පැය තුනයි**

සැලකිය යුතුයි :

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

# I කොටස

**1.** වර්තමානයේ ව්‍යාපාර කටයුතුවල අරමුණු වන්නේ ලාභය හා සමාජ සුභ සාධනය පමණක් නොවේ. වෙනත් අරමුණු ද පවතී.

(i) (අ) එසේ පවතින වෙනත් අරමුණු **හතරක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

(ආ) එම අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර විසින් කරනු ලබන කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

(ii) (අ) ප්‍රාථමික නිෂ්පාදන හා ද්විතීයික නිෂ්පාදන අතර සම්බන්ධතාවය නිදසුන් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

(ආ) ''මිනිස් අවශ්‍යතා පොදු ය. වුවමනා විවිධ ය.'' මෙසේ මිනිස් වුවමනා විවිධ වීමට බලපාන හේතු **හතරක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

(iii) (අ) නිෂ්පාදනය හා නිෂ්පාදිතය (Production and Product) යන යෙදුම් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

(ආ) නිෂ්පාදනය හා පරිභෝජනය එකවිට සිදුවන නිෂ්පාදන ව්‍යාපාර කුමන නමකින් හැඳින්වේ ද? එහි ප්‍රධාන කොටස් **දෙක** දක්වන්න. **(ලකුණු 02යි)**

(iv) ව්‍යාපාර සංවිධානයක බාහිර පරිසරයේ ප්‍රධාන බලවේගයක් වන ආර්ථික පරිසර බලවේගයන්හි විචලනයන් මූල්‍ය සේවා සපයන ව්‍යාපාර සංවිධානයකට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 04යි)**

(v) (අ) ගුණාත්මක මගී ප්‍රවාහන සේවයක් ඇරඹීමට ඔබ අදහස් කරයි නම්, සේවකයන් විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග මොනවා ද? **(ලකුණු 02යි)**

(ආ) ගෝලීයකරණය ව්‍යාපාර කටයුතුවලට හිතකර ලෙස බලපාන ආකාර **හතරක්** දක්වන්න. **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**2.** (i) (අ) ජපන් ව්‍යාපාරිකයෙකු ශ්‍රී ලංකාවේ මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තශාලාවක් මහනුවර නගරයේ ඇරඹීමට අදහස් කරයි. මේ සඳහා අනුමැතිය ලබාදීමේ ව්‍යවස්ථාපිත බලය ඇත්තේ කවර ආයතනයකට ද? එම අනුමැතිය ලබා දීමේ දී කවර සාධක පදනම් කර ගනියි ද? **(ලකුණු 02යි)**

(ආ) ''රටක ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට රජය හා ව්‍යාපාර අතර මනා අන්තර් සම්බන්ධතාවයක් පැවතිය යුතු ය.'' මෙම අදහස පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

(ii) (අ) ''පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිරන්තරයෙන් පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ව දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.'' පාරිභෝගික ආරක්ෂණයේ අවශ්‍යතාව වර්තමානයේ වැදගත් වීමට බලපානු ලබන ප්‍රධාන හේතු **හතරක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

(ආ) පිළිගත් පාරිභෝගික වගකීම් **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

(iii) (අ) ''ස්නේහා'', අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සමත් වීමෙන් පසු උසස් අධ්‍යාපනය වෙනුවෙන් විදේශගත වීමට අදහස් කරයි. මෙම ක්‍රියාවලිය සඳහා සෘජුව ම සම්බන්ධ වන රාජ්‍ය ආයතන **හතරක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

(ආ) තනි ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුත්තේ කුමන අවස්ථාවලදී ද? එහි දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය දක්වන්න. **(ලකුණු 02යි)**

**(iv) (අ)** සුවිමල්, කිසිදුවිටෙක අන් අය සමඟ කරනු ලබන කටයුතු පිළිබඳ ව විශ්වාසය නොතබන අතර, ස්වාධීනව කටයුතු කිරීමට කැමති අයකු වේ. සපුමල්, සහයෝගයෙන් කටයුතු කරමින් අන් අදහස් පිළිගැනීමට කැමති අයෙකි. සුවිමල්ට හා සපුමල්ට ආරම්භ කිරීමට යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ග වෙන වෙන ම දක්වන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ''සෑම සීමාසහිත පොදු සමාගමක් ම ලැයිස්තු ගත සමාගමක් වේ.'' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(v) (අ)** **සමූපකාර වෙළෙඳසැල්වලට රාජ්‍ය අනුග්‍රහයන් ලැබී ඇතත් පුද්ගලික වෙළෙඳසැල් සමඟ තරඟ කිරීමේ දී** විවිධ ගැටළුවලට මුහුණ දේ. එම ගැටළු **දෙකක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** වරලත් ලාභියකු තෝරා ගැනීමේ දී වරලත් හිමියා සලකා බලනු ලබන සාධක **හතරක්** නම් කරන්න.

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**3. (i) (අ)** පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ඉසුරු තම පියාගෙන් උරුම වූ වාහන අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරය, නවීකරණය කර පවත්වා ගෙන යයි.
- රවීන්ද්‍ර ඩෙංගු උවදුර වැළැක්වීමට දේශීය ඖෂධ භාවිත කරමින් මදුරු දඟරයක් හඳුන්වා දෙයි.
- ගයාන් පැරණි ගීතවලට සංගීතය මුසු කරමින් ගීත තැටියක් හඳුන්වා දෙයි.

**1.** මෙම තිදෙනා අතුරෙන් සාර්ථක ව්‍යවසායකයකු ලෙස සැලකෙන්නේ කවුරුන් ද? **(ලකුණු 1/2යි)**

**2.** ඔබ යෝජනා කරන ව්‍යවසායකයා සතු විය යුතු ගති ලක්ෂණ **තුනක්** නම් කරන්න.

**(ලකුණු 1 1/2යි)**

**(ආ)** ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක වන ආයතන **දෙකක්** නම් කර, එම ආයතන සපයනු ලබන පහසුකම් **එක** බැගින් දක්වන්න. **(ලකුණු 02යි)**

**(ii) (අ)** මූල්‍ය ආයතනවල කටයුතුවලට ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සම්බන්ධ වන්නේ කෙසේ ද?

**(ලකුණු 02යි)**

**(ආ)** මූල්‍ය ආයතනයක් විසින් පළ කරන ලද දැන්වීමක පහත සඳහන් සංකේතය දක්නට ලැබුණි.

**BB + (1ka) Fitch Rating**

ඉහත සංකේතයෙන් අදහස් වන්නේ කුමක් ද? **(ලකුණු 01යි)**

ණය ශ්‍රේණිගත කිරීමේ කටයුතු තුළින් ගනුදෙනුකරුට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** දක්වන්න. **(ලකුණු 01යි)**

**(iii) (අ)** චෙක්පතක පිළිපතකින් ගිණුම්හිමියාට ඇති ප්‍රයෝජන මොනවා ද? **(ලකුණු 02යි)**

**(ආ) 1.** මුදල් චෙක්පතක් යනු කුමක් ද? **(ලකුණු 01යි)**

**2.** ''මුදල් චෙක්පතක් රේඛනය කළ නොහැක''. මෙම ප්‍රකාශයට ඔබ එකඟවේ ද? පැහැදිලි කරන්න.

**(ලකුණු 01යි)**

**(iv) (අ)** ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතනයක් යනු කුමක් ද? නිදසුන් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ශ්‍රී ලංකා මහ බැංකුව මෑතක දී රු. **5000/-** නෝට්ටුවක් හඳුන්වා දී ඇත. එවැනි ඉහළ අගයක් සහිත මුදල් නෝට්ටුවක් හඳුන්වා දීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(v) (අ)** වර්තමානයේ විද්‍යුත් මුදල් භාවිත කිරීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙමගින් ගෙවීම් කටයුතු පහසු කර ගැනීම සඳහා යොදා ගනු ලබන පහසුකම් **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** සුරක්ෂිත, රු. **500 000/-** ක් වටිනා හදිසි අනතුරු රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන ඇත. වසරකට පසු ඔහු හදිසි හෘදයාබාධයකින් මිය ගියේය. ඔහුගේ උරුමකරුවන් රක්ෂණ වන්දි ඉල්ලා සිටිය ද රක්ෂණ සමාගම විසින් වන්දි ගෙවීම් ප්‍රතික්ෂේප කර ඇත.

රක්ෂණ සමාගමට එසේ ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ද? නොහැකි ද? පැහැදිලි කරන්න.

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

The National e-learning Portal for The General Education

[3 වැනි පිටුව බලන්න

**4.** **(i)** **(අ)** ශාලිකා හා නාලිකා සම වයසේ සිටින උපාධිධාරී ගුරුවරියන් දෙදෙනෙකි. මාසික වැටුපෙන් අඩුකර ගැනීමේ එකඟත්වයෙන් එකම රක්ෂණ සමාගමකින් ජීවිත රක්ෂණ ඔප්පු දෙකක් ඔවුන් මිල දී ගෙන ඇත. ඔවුන් දෙදෙනාගේ වැටුපෙන් අඩුකරන වාරික මුදල්වල වෙනසක් පවතී. මෙයට බලපෑ හැකි ප්‍රධාන හේතු මොනවා ද? **(ලකුණු 02යි)**

**(ආ)** මෑත කාලයේ ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය නවීකරණය කිරීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම දක්නට ලැබේ. මෙමගින් සමස්ත ප්‍රවාහන පද්ධතියේ වර්ධනයක් අපේක්ෂා කළ හැකි ද? පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ii)** ගොවීහු තම එළවලු හා පළතුරු ගොවිපලෙහි සිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කරා අලෙවි කිරීමත්, ඒවා තොග වෙළෙඳුන් විසින් දිවයින පුරා බෙදාහැරීමත් සිදු කෙරේ.

**(අ)** එළවලු හා පළතුරු ආරක්ෂාකාරීව බෙදාහැරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල එළවලු හා පළතුරු රැස්කර තබා ගැනීමේ දී හා බෙදා හැරීමේ දී භාවිත කළ යුතු ක්‍රමවේදයන් කවරේ ද? **(ලකුණු 02යි)**

**(iii)** සරිත්, ඇඟලුම් අපනයනය කිරීමේ ව්‍යාපාරයක හිමිකරුවෙකි. මෙහි දී සරිත් අනුගමනය කළ යුතු අපනයන ක්‍රියාපටිපාටිය දක්වන්න. **(ලකුණු 04යි)**

**(iv)** **(අ)** වර්තමාන වෙළෙඳපොළ තුළ සුපිරි වෙළෙඳසැල් ක්‍රමයේ වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබුණ ද නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සතිපොළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සතිපොළ තුළින් පාරිභෝගිකයා ලබන වාසිදායක තත්ත්වයන් කවරේ ද? **(ලකුණු 02යි)**

**(ආ)** මෙරට රැකියා නියෝජිත ආයතනයක් සහ විදේශීය රටක රැකියා සපයන ආයතනයන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට යොදා ගත හැකි සන්නිවේදන ක්‍රම නම් කරන්න. **(ලකුණු 02යි)**

**(v)** **(අ)** **1.** බන්ධිත ගුදම යනු කුමක් ද? **(ලකුණු 01යි)**

**2.** බන්ධිත ගුදමකින් ආනයනකරුට ලැබෙන ප්‍රයෝජන මොනවා ද? **(ලකුණු 01යි)**

**(ආ)** විදේශ වෙළෙඳාමේ දී භාවිත කරන ගෙවීම් ක්‍රම **හතරක්** දක්වන්න. **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

## II කොටස

**5.** **(i)** **(අ)** ''කළමනාකරණය, විද්‍යාවක් මෙන් ම කලාවක් ද වේ.'' පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** සැලසුම්කරණය හා පාලනය අතර සම්බන්ධතාවය දක්වන්න. **(ලකුණු 02යි)**

**(ii)** **(අ)** සී/ස රන්සලු සමාගම ළදරු ඇඳුම් නිෂ්පාදන ආයතනයකි. මෙම ආයතනයේ සේවක මණ්ඩලයට නොමිලේ ප්‍රවාහන පහසුකම් ඇතුළු ශුභසාධන පහසුකම් රැසක් ද ක්‍රියාත්මක වේ. තව ද ආයතනයේ නිෂ්පාදන හා අලෙවි ප්‍රමාණයේ ද සීඝ්‍ර වර්ධනයක් දක්නට ඇති අතර, අපතේ යාම් හා නාස්ති වීම් අවම වීමෙන් නිෂ්පාදන පිරිවැයෙහි අඩු වීමක් ද දක්නට හැකි ය. මෙම තත්ත්වය යටතේ ව්‍යාපාරය තුළ ලාභදායිත්වයේ සහ විකුණුම් ආදායමේ සීඝ්‍ර වර්ධනයක් ද පවතී. මෙම සිද්ධියට අදාළව සී/ස රන්සලු සමාගමේ කාර්යක්ෂමතාවය මැනීමට යොදා ගන්නා නිර්ණායක **හතරක්** දක්වන්න. **(ලකුණු 02යි)**

**(ආ)** වර්තමාන ගතික පරිසරය තුළ ව්‍යාපාර සංවිධානවල කළමනාකරණයේ අවශ්‍යතාවය වඩාත් වැදගත් වීමට බලපාන හේතු දක්වන්න. **(ලකුණු 02යි)**

**(iii)** ''සිලෝන් ටෙක්ස්'' ඇඟලුම් කර්මාන්ත ශාලාව වර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ පවත්වාගෙන යයි. එම ආයතනයේ ඇඟලුම් සේවකයන් දිරි ගැන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරයි.

**(අ)** මේ සඳහා ක්‍රියාත්මක කළ හැකි සේවකයන් දිරි ගැන්වීම් ක්‍රම **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ''කණ්ඩායමක සාමාජිකයන්ගේ රැකියාවලට සම්බන්ධ කටයුතුවලට මඟ පෙන්වීමේ හා බලපෑම් කිරීමේ හැකියාව නායකත්වයයි.'' සංවිධානයකට නායකයෙකු අවශ්‍යවීමට හේතු **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

[4 වැනි පිටුව බලන්න

**(iv) (අ)** සංවිධාන ව්‍යුහයක මූලිකාංග මොනවාදැ යි සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ව්‍යාපාර සංවිධානයක සාර්ථකත්වය සඳහා සංවිධානකරණය වැදගත් වීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(v) (අ)** ව්‍යාපාර ආයතනයක මුළු ස්ථාවර පිරිවැය රු. **60 000/-**කි. ඒකකයක විකුණුම් මිල රු. **60/-**කි. මුළු විචල්‍ය පිරිවැය රු. **30 000/-**කි. වෙළෙඳ පිරිවැටුම රු. **60 000/-**කි. මෙම ව්‍යාපාරයේ සමච්ඡේද ලක්ෂයට අදාළ නිෂ්පාදන ඒකක ගණන කොපමණ ද? **(ලකුණු 02යි)**

**(ආ)** සමච්ඡේද ලක්ෂ්‍ය ගණනය කිරීමෙන් ව්‍යාපාර ආයතනයකට ලැබෙන ප්‍රයෝජන කවරේ ද? **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**6. (i) (අ)** අලෙවිකරණය මානුෂික සහ සමාජීය ක්‍රියාවලියක් ලෙස සලකන්නේ ඇයි? පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ''අලෙවිකරණය ව්‍යාපාරිකයන්ට පමණක් නොව රටේ ආර්ථිකයට සහ පාරිභෝගිකයාට ද එකසේ වැදගත්ය.''

**1.** අලෙවිකරණය රටේ ආර්ථිකයට වැදගත් වන්නේ කෙසේ ද? **(ලකුණු 01යි)**

**2.** අලෙවිකරණය පාරිභෝගිකයාට වැදගත් වන්නේ කෙසේ ද? **(ලකුණු 01යි)**

**(ii) (අ)** සාර්ථක වෙළෙඳපොළ ඛණ්ඩනයන් සඳහා කවර අවශ්‍යතා ඉටුවිය යුතු ද? **(ලකුණු 02යි)**

**(ආ)** ''අලෙවිකරුවකු සේවා සැපයීමේ දී මූලික කර ගනු ලබන්නේ භාණ්ඩය.'' නිදසුනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(iii) (අ)** අලෙවි මිශ්‍රය, භාණ්ඩ අලෙවි මිශ්‍රය හා සේවා අලෙවි මිශ්‍රය ලෙස වර්ග කළ හැකි ය. භාණ්ඩ හා සේවා අලෙවි මිශ්‍රවල උපවිචල්‍යයන් වෙන් වෙන් වශයෙන් දක්වන්න. **(ලකුණු 02යි)**

**(ආ)** නිෂ්පාදිත මට්ටම් **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(iv)** වර්තමානයේ වෙළෙඳපොළට ඉදිරිපත් කරන සෑම භාණ්ඩයක්ම සන්නාම නාමයක් සහිතව ඉදිරිපත් කෙරේ.

**(අ)** සන්නාමක පැවතිය යුතු ගුණාංග **හතරක්** දක්වන්න. **(ලකුණු 01යි)**

**(ආ)** සන්නාම වර්ග **දෙකක්** නිදසුන් සහිතව දක්වන්න. **(ලකුණු 01යි)**

**(ඉ)** නිෂ්පාදිතයක මිල නියම කිරීමේ දී පිරිවැය, ඉල්ලුම හා තරගය යන සාධකවලට අමතරව සලකා බලන අනෙකුත් සාධක **දෙකක්** දක්වන්න. **(ලකුණු 01යි)**

**(ඊ)** ඒකකයක ස්ථාවර පිරිවැය රු. **4/-**කි. මුළු විචල්‍ය පිරිවැය රු. **20 000/-**කි. අපේක්ෂිත නිෂ්පාදන ඒකක **1000**කි. නිෂ්පාදකයා විකුණුම් මිලෙන් **20%**ක ලාභයක් අපේක්ෂා කරයි නම්,

**1.** ඒකකයක විකුණුම් මිල කොපමණ ද? **(ලකුණු 1/2යි)**

**2.** වෙළෙඳ පිරිවැටුම කොපමණ ද? **(ලකුණු 1/2යි)**

**(v) (අ)** සී/ස විශ්මිත (පෞද්) සමාගමට පරිගණක වැඩසටහන් සම්පාදක තනතුර සඳහා රැකියා දැන්වීමක් සකස් කර දෙන ලෙසට ඔබගෙන් ඉල්ලීමක් කෙරේ. ඒ අනුව රැකියා දැන්වීමක් සකස් කරන්න. **(ලකුණු 03යි)**

**(ආ)** රැකියා දැන්වීම් පළ කෙරෙන මාධ්‍යවලට නිදසුන් දෙන්න. **(ලකුණු 01යි)**

**(මුළු ලකුණු 20යි)**

**7. (i)** ''සුමිහිරි නිෂ්පාදකයෝ'' කිරි ආශ්‍රිත නිෂ්පාදිත වෙළෙඳපොළට සපයන ව්‍යාපාර ආයතනයකි. කිරි ආහාර නිෂ්පාදිත ආයතනයක අරමුණ විය යුත්තේ ''නැවුම් නිෂ්පාදිත'' පාරිභෝගිකයාට අලෙවි කිරීමයි.

**(අ)** සුමිහිරි ආයතනය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු මොනවා ද? **(ලකුණු 02යි)**

**(ආ)** ගුණාත්මයෙන් යුත් අමුද්‍රව්‍ය මිලට නොගැනීම නිසා ඇති විය හැකි ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ii) (අ)** ''ඡායාරූප ශිල්පී නවීන්, ලැබෙන ඇරයුම් මත විවිධ උත්සව අවස්ථා ඡායාරූප ගත කරනු ලබන වෘත්තීය ඡායාරූප ශිල්පියෙකි.''

**1.** ඡායාරූප ශිල්පී නවීන් ක්‍රියාත්මක කරන නිෂ්පාදන ක්‍රමය නම් කරන්න. **(ලකුණු 01යි)**

**2.** අනෙක් නිෂ්පාදන ක්‍රමවලින් එය වෙනස් වීමට පදනම් වන නිර්ණායක මොනවා ද? **(ලකුණු 01යි)**

The National e-learning Portal for The General Education

[5 වැනි පිටුව බලන්න

**(ආ)** **1.** නිෂ්පාදිතයක ගුණත්වයට බලපාන අංගෝපාංග මොනවා ද? **(ලකුණු 01යි)**

**2.** තත්ත්ව ආරක්ෂණය යනුවෙන් කුමක් අදහස්වේ ද? **(ලකුණු 01යි)**

**(iii)** **(අ)** නිෂ්පාදන ආයතනයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීමේ දී මුළු පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය හා තොග පවත්වාගෙන යාමේ පිරිවැය කිනම් ස්වරූපයක් ගන්නේදැ යි ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** පිරියත සැලැස්මක් ස්ථාපිත කිරීමේ දී සලකා බලන කරුණු මොනවා ද? **(ලකුණු 02යි)**

**(iv)** **(අ)** පුහුණුව හා සංවර්ධනය තුළින් සේවා යෝජකයාට හා සේවකයාට අත්වන ප්‍රතිලාභ **දෙක** බැගින් සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** යහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රයෝජන මොනවාදැ යි පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(v)** **(අ)** ''මානව සම්පත් කළමනාකරුගේ බලතල සිරස් ලෙස හා තිරස් ලෙස ක්‍රියාත්මක වේ. මෙම තත්ත්වය අනෙකුත් කළමනාකරුවන්ගේ බලතල හා වෙනස් වේ.'' පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** රැකියා නිර්මාණය හා රැකියා විශ්ලේෂණය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**8.** **(i)** **(අ)** ''කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙන්, සමාගම්වලට නව ප්‍රාග්ධනය සම්පාදනය නොකරයි.'' ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද යන්න හේතු දක්වන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ආයෝජන කළඹ යනු කුමක් ද? නිදසුනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ii)** **(අ)** සීමිත සමාගමක අධිතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් සහ ඉහළ ලාභදායකත්වයක් පවතින විට, වඩා සුදුසු ණයකර නිකුත් කිරීමක් ද කොටස් නිකුත් කිරීමක් ද ? පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ඌනකාරක ප්‍රාග්ධන තත්ත්වයක් අවම කර ගැනීමට ව්‍යාපාරයකට ගතහැකි ක්‍රියාමාර්ග මොනවා ද? **(ලකුණු 02යි)**

**(iii)** **(අ)** කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම් වර්ග **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** මිලංක මිල දර්ශකය වෙනුවට හඳුන්වා දුන් S&P ශ්‍රී ලංකා 20 දර්ශකය සකස් කිරීමට යොදාගත් අන්තර්ජාතික ප්‍රමිතීන් නම් කරන්න. **(ලකුණු 02යි)**

**(iv)** ශ්‍රී ලංකාවේ විවිධ ව්‍යාපාර ආයතන විසින් තම ආයතන පරිශ්‍රය තුළ **Wi-Fi** පහසුකම් නොමිලයේ ලබා දීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙම පහසුකම් ව්‍යාප්තවීම තුළින් ඒ ඒ ව්‍යාපාර ආයතනවලටත්, ගනුදෙනුකරුවන්ටත් ලැබෙන ප්‍රයෝජන වෙන වෙන ම සඳහන් කරන්න. **(ලකුණු 04යි)**

**(v)** **(අ)** මුදල් ප්‍රවාහ ප්‍රකාශය හඳුන්වා, එහි මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් සඳහා නිදසුන් **දෙක** බැගින් දක්වන්න. **(ලකුණු 03යි)**

**(ආ)** ''ව්‍යාපාර සැලැස්මක් නොමැති ව්‍යාපාරය හබල බිඳුණු ඔරුවක් සේ ය.'' පැහැදිලි කරන්න. **(ලකුණු 01යි)**

**(මුළු ලකුණු 20යි)**

***

The National e-learning Portal for The General Education